ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

ගුරු අධ්‍යාපන ශාස්ත්‍රපති උපාධිය I කොටස

අවසාන පරීක්ෂණය 2006

ගුරු අධ්‍යාපනය පිළිබඳ පර්යාලෝකනයන් **- ESP 1262**

කාලය - පැය තුනයි (03)

දිනය : 2006.03.09 වේලාව : පෙ.ව.10.00 සිට ප.ව.01.00 දක්වා

ප්‍රශ්න <u>තුනකට *(03)* පමණක්</u> පිළිතුරු සපයන්න.
සෑම පිළිතුරක් සඳහාම වෙනම පොතක් භාවිතා කළ යුතුයි.

01. **i.** "ගුරු පුහුණුව" සහ "ගුරු අධ්‍යාපනය" යන සංකල්ප පැහැදිලි කර ගුරුවරුන් ඔවුන්ගේ වෘත්තීය භූමිකා සඳහා සූදානම් කරවීමෙහිලා මෙම සංකල්පවල වැදගත්කම දක්වන්න.

(ලකුණු 08)

**ii.** ආරම්භක අවස්ථාවකදී පමණක් ලබන ලද ගුරු අධ්‍යාපනය හැමදාටම නොසෑහෙන්නේ මන්දැයි නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

**iii.** ශ්‍රී ලංකාවේ ගුරුවරුන්ට ඔවුන්ගේ වෘත්තියමය වර්ධනය සහ සංවර්ධනය සඳහා අධ්‍යාපනය අඛණ්ඩව කර ගෙන යාමට දැනට පවතින අවස්ථා විස්තර කරන්න.

(ලකුණු 09)

**iv.** අපේ රටට උචිත ඵලදායී සහ කාර්යක්ෂම ගුරු අධ්‍යාපන ක්‍රමයක් සංවර්ධනය කර ගැනීම සඳහා උපදෙස් සංග්‍රහයක් සකස් කරන්න.

(ලකුණු 08)

02. "ගුරුවරයා අති විශිෂ්ඨ ස්ථානයක් දරයි. අධ්‍යාපනයේ අතරමැදි කාර්යභාරය ඔහු මත රැඳී පවතී. ඔහු සතු බලය මත අධ්‍යාපන දියුණු කිරීම හෝ විනාශ කිරීම සිදුවේ. මෙම කරුණ බෙහෙවින් වැදගත් වන බැවින්, ඔහු පැමිණෙන්නේ කොතැනක සිටද ? ඔහුගේ දායකත්වය කුමක් ද? යන්න රට විසින් දැන ගත යුතුය. සංස්කෘතියේ හා සම්ප්‍රදායන්හි ඉතා අගනේ යැයි සැලකෙන සියල්ල සුරක්ෂණය කරනා පිරිමි හා ගැහැණු කණ්ඩායම් ක්‍රියාකාරීව පවත්වා ගන්නා අතරම, විපර්යකාරකයකු **(Agent of change)** ලෙස ශීඝ්‍රයෙන් ඉදිරියට ද ගමන් කළ යුතුය."
(අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කමිටු වාර්තාව - 1979)

ඉහත වගන්තිය සැලකිල්ලට ගනිමින් ගුරුවරයකු විසින් පහත දැක්වෙන ආකල්ප හා කුසලතා දැරීම අවශ්‍ය වන්නේ මක්නිසාදැයි නිදසුන් දක්වමින් විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

(අ) වෘත්තීය උදෙසා සේවය කිරීම හා කැපවීම පිළිබඳ හැඟීම.

(ආ) වගවීම (**Accountability**)

(ඇ) කළමනාකරණය

(ඈ) තම සමවිය කණ්ඩායම (සගයින්), දෙමාපියන් හා ප්‍රජාවේ සාමාජිකයින් සමග සම්බන්ධතා ගොඩ නගා ගැනීම.

(ලකුණු 8+8+8+9 = 33)

03. **i.** "අධ්‍යාපනයෙහි ප්‍රජාතාන්ත්‍රීකරණය" යන සංකල්පය හා එය මානව සංවර්ධනයට යොමුවන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 08)

**ii.** ලෝකයේ විවිධ කලාපවල පාසලට ඇතුළත් වීමේ සංඛ්‍යා සංසන්දනය කිරීමේදී සංවර්ධිත රටවල සංවර්ධනය වෙමින් පවතින රටවල්වලට වඩා පාසලට ප්‍රවේශවීම ඉහළ මට්ටමක පවතින අතර, ඒවායෙහි ස්ත්‍රී-පුරුෂ විෂමතාවන් ද වඩා පහළ මට්ටමක පවතී. සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල් අතර ඉහත දැක්වූ අසමානකම් ඇතිවීමට හේතු ලෙස ඔබ සලකන්නේ මොනවා ද?

(ලකුණු 10)

**iii.** පාසලට ඇතුලත් වන සිසුන් සංඛ්‍යාව නැංවීමට ශ්‍රී ලංකාව ක්‍රියාමාර්ග කිහිපයක් හඳුන්වා දී ඇතත් තවමත් පූර්ණ ප්‍රවේශයක් කරා එළඹීමට නොහැකිව ඇත. ඔබේ පාසල් ප්‍රජාව තුළ පාසලට ඇතුලත් නොවීම හා කලින් පාසල හැරයාමට බලපාන හේතු විශ්ලේෂණය කරන්න. ප්‍රජාවේ ස්වභාවය, එහි භූගෝලීය හා සමාජ -ආර්ථික සාධක, ජනතාවගේ පසුබිම් ලක්ෂණ හා අධ්‍යාපනය සඳහා ඇති පහසුකම් ආදිය අලලා ඔබේ විශ්ලේෂණය කරන්න.

(ලකුණු 15)

04. **i.** වෘත්තික සංගමයක (**Professional body**) ප්‍රධාන ලක්ෂණ හඳුන්වා දෙන්න.

(ලකුණු 08)

**ii.** වෘත්තීක සංගමයක් මගින් එහි ගුරු සාමාජිකයින්ගේ වෘත්තීය සංවර්ධනයට දායක විය හැකි ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 12)

**iii.** ගුරු භවතුන්ගේ වෘත්තික සංගමයක් හා ගුරු ආචාර ධර්ම පද්ධතියක් අතර ඇති සම්බන්ධය ඔබ පැහැදිලි කරන්නේ කෙලෙසින් ද?

(ලකුණු 13)

05. "අධ්‍යාපනය, එය ක්‍රියාත්මක වන සංස්කෘතියෙන් හා ප්‍රජාවෙන් වෙන් කළ නොහැක. ගුරුවරුන් විශේෂයෙන් අවට ප්‍රජාව තුළ විපර්යකාරකයකු වශයෙන් බහුවිධ භූමිකාවක් දැරීමට සවිබලකරණය විය යුතුය."
කනිංහැම් (1998)

i. "ගුරු සවිබලකරණය" **(Empowerment of teachers)** යන යෙදුම නිර්වචනය කරන්න.

(ලකුණු 08)

ii. අවට ප්‍රජාවේ විපර්යකාරකයකු **(Agent of change)** වශයෙන් කටයුතු කිරීමට ගුරුවරයකු විසින් නිරත විය යුතු බහුවිධ භූමිකාව **(multiple role)** පැහැදිලි කරන්න.

(ලකුණු 12)

iii. ප්‍රජාව තුළ විපර්යකාරකයකු වශයෙන් කටයුතු කිරීම සඳහා ගුරුවරුන් සවිබලකරණයට භාවිත කළයුතු උපාය මාර්ග මොනවාද ?

(ලකුණු 13)

06. පහත දැක්වෙන මාතෘකා පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. ඉගැන්වීම වෘත්තියක් ලෙස පිළිගැනීමට තිබිය යුතු නිර්ණායක.

ii. ඵලදායී ගුරුවරයකුගේ ගති ලක්ෂණ

iii. ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය උදෙසා ඇති විවෘත ප්‍රවේශයන්

(ලකුණු 11 x 3 = 33)

- හිමිකම් ඇවිරිණි. -